**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2017**

**-----------------------------------------------------**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්ති ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත 2018 මැයි 10 දින නිකුත්කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව ප්‍රමිතය මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හෝ වියදම් හිලව් නොකළ යුතු වුවත්, ලෝක සමුද්‍ර දිනය සැමරීම හා ජාත්‍යන්තර වෙරළ පවිත්‍රතා වැඩසටහන යන කරුණු දෙක සඳහා වූ ආදායම් හා වියදම් හිලව් කර ශුද්ධ වියදම ලෙස පිළිවෙලින් රු.1,991,069 ක් හා රු.2,865,092 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2

ප්‍රමිතයේ අරමුණු ඡේදය පරිදි ආයතනයෙහි ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ලබාගත් ආකාරය හා එම මුදල් භාවිතා කළ ආකාරය දක්වමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතු වුවද, ඊට පටහැනි ලෙස උපචිත පදනම මත ගිණුම්ගත කළ රු.18,751,505 ක ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයේ 25 ඡේදය පරිදි යම් වත්කමක් අත්කරගෙන ඇති විට, අත්පත් කර ගත් දිනයට පවතින සාධාරණ වටිනාකමට ගිණුම්ගත කළ යුතු වුවද මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ගාල්ල උපකාර්යාලය වෙත ලබාදී තිබූ දේපල පිරියත හා උපකරණ අයිතම් 32 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජංගම නොවන වත්කම් ක්ෂය කිරීම සඳහා ආයතනය විසින් හඳුනාගෙන තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.247,750 ක් වූ වත්කම් අයිතම් 03 ක් සඳහා ක්ෂයවීම් සිදුකර නොතිබුණි.

(ආ) රසායනාගාර ද්‍රව්‍ය හා වීදුරු උපකරණ මිලදීගත් වර්ෂයේ වියදමක් ලෙස කපා හැරීම අධිකාරියේ ප්‍රතිපත්තිය වුවද, 2018 ජනවාරි මාසයේදී ගෙවීම් කර භාණ්ඩ ලැබී තිබුණු රු.1,764,198 ක් වූ උපකරණ සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස කපා හැර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනය විසින් 2018 මාර්තු 12 වන දින සිදුකළ භෞතික තොග සත්‍යාපනය අනුව ලිපි ද්‍රව්‍ය තොග වටිනාකම රු.187,078 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සිදුවී තිබූ වරදක් නිවැරදි කිරීමේදී වටිනාකම රු.3,055,941 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ලී බඩු හා උපකරණ ගිණුමෙන් ඉවත් කිරීම වෙනුවට ක්ෂය වෙන්කිරීමේ ගිණුමට බැර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී වාහන අනතුරු 09 ක් වෙනුවෙන් රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණු රු.2,991,897 ක් හා ඒ සමාන අළුත්වැඩියා වියදම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2018 ජනවාරි හා පෙබරවාරි මාසවලදී ගෙවන ලද හා 2018 වර්ෂයේදී අධිකාරිය වෙත ලැබී තිබුණු වටිනාකම රු.7,076,006 ක් වූ වත්කම් සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණ යටතේ සටහන් කිරීම හේතුකොටගෙන එම ගිණුම අධිගණනය වී තිබුණි.

(ඉ) ආගන්තුක ආක්‍රමණශීලි ජීවීන් පාලනය කිරීමේ ව්‍යාපෘතියෙන් 2017 වර්ෂයේදී අධිකාරිය වෙත ලැබුණු වටිනාකම රු.316,975 ක් වූ වත්කම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඊ) සමුද්‍ර පරිසරය ආරක්ෂා කර ගැනීමේ ක්‍රමෝපායන් සහිත ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා ස්වභාවධර්මය සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය සමඟ එළඹ තිබුණු ගිවිසුමට අනුව 2018 වර්ෂයේදී ගෙවීමට නියමිත රු.2,850,624 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------

වැඩමුළු, වැඩසටහන් හා දැන්වීම් පුවරු 08 ක් සඳහා වැය කරන ලද එකතුව රු.375,875 ක් වූ ගෙවීම් සනාථ කිරීම සඳහා වූ ලදුපත් හා පැමිණීමේ සහතික විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ 18.2 වගන්තිය | පනතට අනුව පිහිටුවා ඇති අරමුදලින් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, කර්තව්‍ය ඉටුකිරීමේදී හා කාර්යය කිරීමේදී දැරීමට වන වියදම් පමණක් අරමුදලින් ගෙවිය හැකි වුවද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත මෙම අරමුදලින් රු.5,762,064 ක් සේවක ණය අරමුදලකට බැර කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛය | රාජ්‍ය අංශයේ උත්සව, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා අපේක්ෂිත පරමාර්ථ ලඟාකර ගත හැකි වන පරිදි අවම පිරිවැයක යටතේ සංවිධානය කිරීමට සුදුසු හෝටල් හා සම්මන්ත්‍රණ ශාලා තෝරාගත යුතු බව දක්වා තිබුණද අධිකාරිය විසින් ඒ අනුව කටයුතු නොකර අවස්ථා 04 කදී රු. 982,160 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------------ | |
| | (i) මුදල් රෙගුලාසි 104 (1) (අ) | පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවද වටිනාකම රු.519,624 ක් වූ වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii)මුදල් රෙගුලාසි 104 (4) | අනතුරක් සිදුවී මාස 03 ක් ඇතුළත එම අනතුරට වගකිව යුත්තන් නිශ්චය කර අලාභ හානි තක්සේරු කර පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් අනතුරු 02 ක් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 211 | සියළුම බැරකම් අප්‍රමාදව පියවීමට කටයුතු කළ යුතු වුවද 2016 දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම රු.5,007,086 වූ බැරකම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 156 (7) | ගණන් දීමේ නිලධාරියා මූල්‍ය ගණුදෙනුවලදී නිසි පිරිමැසුම් භාවයෙන් ක්‍රියා කළ යුතු බව දක්වා තිබුණද කරන ලද නියැදි පරීක්ෂාවේදී රු.10,000 සිට රු.72,000 ක්වූ පරාසයක මුදල් නිලධාරීන් අත රඳවාගෙන තිබූ අවස්ථා 16 ක් නිරීක්ෂණය විය. |
| | (v) මුදල් රෙගුලාසි 1642 | අනතුරක් සිදුවූ වහාම ලඟම ඇති පොලිසියට වාර්තාකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (vi) මුදල් රෙගුලාසි 1645 (අ) | දෛනික ධාවන සටහන් වගකිව යුතු නිලධාරීන් ලවා නිති පතා පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතු වුවද ප්‍රාදේශීය කාර්යාලවල ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අග්‍රිම මුදල් ලබාදීම වෙනුවට බැංකු පෙර ගෙවුම් කාඩ්පත් භාවිතා කළ හැකි බව දක්වා ඇතත් අධිකාරිය ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි. |
| (ඉ) | 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල සියලු වත්කම් සම්බන්ධ පරිගණක දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය රජය විසින් අවධාරණය කර තිබුණ ද වටිනාකම රු. 200,736,374 ක් වූ වත්කම් සඳහා අධිකාරිය විසින් එසේ කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.35,611,914 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,966,368 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.32,645,546 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම රු. 45,975,990 කින් අඩුවීම වැටුප්, සේවක ප්‍රතිලාභ හා අනිකුත් පුනරාවර්තන වියදම් රු. 15,659,134 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු. 1,814,711 ක ඌනතාවය සමාලෝචිත වර්ෂයේදී රු. 35,611,914 ක් දක්වා වැඩිවී තිබුණි. නමුත් සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු අධිකාරියේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දායකත්වය සියයට 19 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

### 4.1.1 සැළසුම් කිරීම

ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද එය ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් අධිකාරිය විසින් හඳුන්වා දී නොතිබූ අතර සමුද්‍රීය පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම, පාරිසරික සංවේදී සිතියම් පිළියෙල කිරීම, වරාය ජෛව විද්‍යාත්මක සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම හා අධිකාරියේ පනත සංශෝධනය කිරීම ආදි ක්‍රියාකාරකම් වර්ෂය තුළ ඉටු වී නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හලාවත කාර්යාලයට අදාල හලාවත කලපුවෙහි ප්‍රධාන මෝයකට ආසන්නයේ පිහිටි කුරුසපාඩුව ප්‍රදේශයේ පිහිටි භූමියකට හලාවත නගර සභාව විසින් අවිධිමත් ලෙස කසළ මුදාහැරීම සම්බන්ධයෙන් පනතේ පවතින නෛතික බලතල ක්‍රියාත්මක කර අදාල දඩ පනවා සමුද්‍ර දූෂණය වැලැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ සමුද්‍ර පරිසරය ආරක්ෂා කිරීම සඳහා ක්‍රමෝපායන් සහිත ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා 2017 අගෝස්තු 15 දින රු.5,938,800 වටිනාකමකින් මාස 05 කින් නිම කිරීමේ අපේක්ෂාවෙන් ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ සඳහා අධිකාරිය විසින් 2017 නොවැම්බර් වන විට රු.3,088,176 ක් ගෙවා තිබුණු අතර කටයුතු සම්පූරණ කර ඇතත් 2018 මාර්තු වන විටත් අවසාන වාර්තාව අධිකාරිය වෙත ලැබී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා උපයෝජනය කිරීමට වෙන්කර තිබූ 2014, 2015 හා 2016 වර්ෂවලට අදාල රු.3,604,039 ක මුදලක් එම කාර්යයන් ඉටුකිරීමකින් තොරව මහා භාණ්ඩාගාරය වෙත 2017 දෙසැම්බර් 28 දින ආපසු පියවා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බදු කාල සීමාව 2018 නොවැම්බර් මාසයේදී අවසන් වූ අතර ඉන්මතු කාල දිගුවක් ලබා නොදෙන බව බදු හිමිකරු විසින් අධිකාරිය වෙත දන්වා තිබුණි. ඒ අනුව මෙම ගොඩනැගිල්ල සංවර්ධනය කිරීමට අධිකාරිය විසින් වැය කර ප්‍රාග්ධනිත කර තිබුණු රු.1,354,199 ක් 2018 වර්ෂයේදී හානිකරණය කිරීමට සිදුවීම පිළිබඳ හෙළිදරව්කර නොතිබුණි.

(ඇ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස 2017 නොවැම්බර් මාසයේදී ලැබී තිබූ රු.177,075 ක් වූ පරිගණක උපාංග අයිතම් 05 ක් ඉන්වෙන්ට්‍රි ලේඛන වල ඇතුළත් කර නොතිබුණු අතර අනාරක්ෂිතව ගබඩාව තුළ තබා තිබුණි.

(ඈ) අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවා පහසුකම් සැපයීම සඳහා වරායයන් තුළ සේවා නියුක්ත කර ඇති නිලධාරීන් සඳහා 2010 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දිනකට රු. 750 බැගින් දීමනාවක් හා 2016 වර්ෂයේ සිට දිවා, රාත්‍රී වැඩමුර අනුව නව ගෙවීම් ක්‍රමවේදයකට දීමනා ගෙවා ඇතත් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එකතුව රු. 1,951,550 ක් දීමනා ගෙවීම සඳහා වැය කර තිබුණි.

(ඉ) හරිත ධීවර වරාය ව්‍යාපෘතිය යටතේ මිරිස්ස ධීවර වරාය හරිත ධීවර වරායක් ලෙස ගොඩනැගීම සඳහා රු. 33,783,341 ක් වැය වී තිබූ අතර මෙම ව්‍යාපෘතියේ සමස්ත කටයුතු 2016 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණද 2018 ජනවාරි 25 වන විටත් ශ්‍රී ලංකා වරාය නීතිගත සංස්ථාවට පැවරීම් සිදුකර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එක් එක් ප්‍රාදේශීය කාර්යාලයට අයත් බල ප්‍රදේශ තුළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා (ඩම්පින්) බලපත්‍ර ලබාගත යුතු නමුත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා නොකරන ආයතන පිළිබඳව වාර්තා කැඳවා නීති අංශය මගින් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් පිටකරන ජලය උෂ්ණත්වයෙන් අධිකවීමත්, ගල් අඟුරු බෑමේදී මුහුදට ගල් අඟුරු වැටීමත් හේතුවෙන් පාරිසරික හා සාගර දූෂණය සිදුවන නමුත් මෙය අවම කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගයන් අධිකාරිය විසින් ගෙන නොතිබුණි.

(ඇ) තංගල්ල කහද මෝදර හෝටලයකින් අපද්‍රව්‍ය සාගරයට බැහැර කිරීම හා වරාහේන පොදු මල අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය නිසියාකාරව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඇති වී ඇති පරිසර දූෂණය සම්බන්ධයෙන් කඩිනම් විසඳුම් ලබාගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලය හා කොළඹ වරාය කාර්යාල සඳහා රු.378,123 ක් වැය කර 2016 දෙසැම්බර් සවිකර තිබූ කැමරා පද්ධතිය වසරකට වැඩි කාලයක සිට අක්‍රීයව පැවතුණි.

(ආ) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අධිකාරිය වෙත ලැබුණු වටිනාකම සොයාගත නොහැකි වූ ලොරි රථයක් හා අධිකාරිය සතු වටිනාකම රු.722,000 ක් වූ ඩිංගි බෝට්ටුවක් වර්ෂ හතරකට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

---

සමාලෝචිත වර්ෂයේදී රු. 450,000 ක් වටිනාකම වූ තර්බිඩිටි මීටර්ස් (Turbidity meters) 03 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සුදුසුකම් ලැබූ අවම ලංසුකරු වෙනුවට දෙවන ලංසුකරු තෝරා ගැනීම හේතුවෙන් රු.48,420 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩලයේ තනතුරු 22 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් තෘතීය හා ද්විතීය මට්ටමේ තනතුරු 12 ක් පුරප්පාඩු වීම අධිකාරියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය අඩුවීමට බලපා තිබුණි.

(ආ) බඳවාගැනීමේ පටිපාටිය අනුව ප්‍රාථමික හා ද්විතියික මට්ටමේ තනතුරු සඳහා වර්ෂ තුන සම්පූර්ණ වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු වුවද එකී විභාග නොපවත්වා අධිකාරියේ සේවකයින් සඳහා වැටුප් වර්ධක ගෙවා තිබුණි.

(ඇ) නව බඳවා ගැනීම් ක්‍රියාපටිපාටියක් සකස් කර තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 5. තිරසර සංවර්ධනය

---

### තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

---

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යය සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ලඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

----------------------

අනුමත කාර්ය මණ්ඩලය අනුව අභ්‍යන්තර විගණන අංශය තුළ අභ්‍යන්තර විගණක හා විගණන නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කළ යුතු වුවද, අභ්‍යන්තර විගණක හා කළමනාකරණ නිලධාරියෙකු පමණක් එම අංශයට අනුයුක්ත කර තිබුණි. ඒ හේතුවෙන් වැඩි ක්ෂේත්‍ර ප්‍රමාණයක් විගණනයේදී ආවරණය කිරීමට නොහැකිව තිබූ බව නිරීක්ෂණය විය.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් තාත්ත්වික ආකාරයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි

(ආ) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය හා වරාය කාර්යාලය සඳහා ආරක්ෂක (සීසී ටීවී) කැමරා පද්ධතියක් සවිකිරීමේදී පිරිවිතර යටතේ ඇතුළත්ව තිබුණ උපාංගයක් අමතර උපාංගයක් ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකර තිබුණු අතර ආරක්ෂක කැමරා මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස කටයුතු කළ කමිටුවේ නිර්දේශය ලබා නොගෙන රු.64,665 ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ විධිවිධාන යටතේ, 2012 අංක 01 දරන නියෝගයට අනුව තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් නියාමනය කර නොතිබුණි.

(ආ) ධීවර වරායන්හි පවතින අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ඇ) මුහුදු සීමාවේ සිට මීටර් 300 ක් ගොඩබිම දක්වා වූ සීමාවේ මුහුදට අපද්‍රව්‍ය බැහැරවන ආකාරයෙන් තනා ඇති වැසිකිළි හා අපද්‍රව්‍ය යළි ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දැමීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැනුවත් කිරීමටත්, ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දමන අපද්‍රව්‍ය හේතුවෙන් සංචාරක කර්මාන්තයට විශේෂ බලපෑමක් විය හැකි බැවින් එම ගැටළුව සම්බන්ධව සංචාරක සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා කර ඉදිරියේදී ක්‍රියාකළ හැකි ආකාරය පිළිබඳව වාර්තාවක් සකස් කිරීමට 2013 වර්ෂයේදී පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටුවේදී තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම එය ඉටුකර නොතිබුණි.

**07. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) කාර්ය මණ්ඩලය පරිපාලනය | බඳවාගැනීමේ කටයුතු, උසස්වීම් ලබාදීම හා විනය පරීක්ෂණ යනාදී කටයුතු විධිමත්ව සිදු නොකිරීම. |
| (ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | නියමිත දිනට ව්‍යාපෘති අවසන් කර නොතිබීම හා ව්‍යාපෘතිවලට අදාල අවසන් නිරීක්ෂණ හා ගිණුම් ලබාගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) සැලසුම් ක්‍රියාත්මක කිරීම | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු විධිමත් කර නොතිබීම හා පසුවිපරම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබීම. |
| (ඈ) මූල්‍ය පාලනය | වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වෙන්කර ඇති ප්‍රතිපාදන කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ඒ සඳහා අධිවැය දරා තිබීම. |
| (ඉ) තොග පාලනය | භාණ්ඩ ගබඩාවට භාරගැනීම, නිකුත් කිරීම හා ලේඛනගත පොත් යාවත්කාලීන කර නොතිබීම. |
| (ඊ) වාහන පාලනය | ලොග් පොත්, ධාවන සටහන් පත්‍රිකා හා සහතික කිරීම් යාවත්කාලීන කර නොතිබීම හා වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබීම. |